වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
தேசிய கல்வி ஆணைக்குழு
National Education Commission

2024

පළමු මහල, බ්ලොක් 05, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07

1ம் மாடி 5ம் கட்டிடத் தொகுதி பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபம் கொழும்பு 07

1st Floor, Block 05, BMICH, Colombo 07.

වාර්ෂික වාර්තාව 2024

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

වැය ශීර්ෂය 335

සභාපතිතුමියගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පැවරී තිබෙන ප්‍රධාන කාර්යයන්ට අදාළව ජාතික වශයෙන් වැදගත් වන අධ්‍යාපන ප්‍රතිපත්ති නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සාර්ථකව අවසන් කිරීමට හැකිවූ වසරක් ලෙස 2024 වර්ෂය හඳුන්වා දිය හැකිය.

ජාත්‍යන්තර පාසල් නියාමනය සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත කරන ලද සුවිශේෂී ඉල්ලීම අනුව වහා ක්‍රියාත්මක වීමට, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පියවර ගන්නා ලදී. ඒ අනුව සමාගම් පනත හෝ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි වී ඇති ජාත්‍යන්තර පාසල් සහ අනිකුත් පෞද්ගලික පාසල් විධිමත් නියාමනයකට ලක්කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ සකස් කර අවසන් වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශයට භාරදීමට කටයුතු කරන ලදී. තවදුරටත් මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනකටද දායක වූ බව සතුටින් ප්‍රකාශ කර සිටිමි.

එමෙන්ම පාසල්වල ඉගැන්වීමේ මාධ්‍යය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වගකීම ද අප වෙත පැවරුණි. මේ සඳහා විශේෂඥ කණ්ඩායමකගේ ද සහභාගීත්වය සහිතව සිදුකළ පුළුල් අධ්‍යයනයකින් පසු ප්‍රාථමික හා ද්විතියික අවධි සඳහා සුදුසු ඉගැන්වීම් මාධ්‍යයක් පිළිබඳ නිර්දේශ සකස් කිරීම ද 2024 වසරේදී සාර්ථකව අවසන් කිරීමට හැකිවිය. ද්විභාෂා අධ්‍යාපනය හා දෙවන භාෂාවක් ඉගැන්වීමේ එනම් සිංහල සිසුන්ට දෙමළ භාෂාවත්, දෙමළ සිසුන්ට සිංහල භාෂාවත් ඉගැන්වීමේ අවශ්‍යතාවය මෙහිදී මතු කර ඇත. මෙම නිර්දේශ සැලකිල්ලට ගෙන ඒවා ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරෙන වගකීම පිළිබඳව ද අදාළ නිලධාරීන් සමග සාකච්ඡාවක් ද පැවැත්වීමට හැකි විය.

13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනෙහි වර්තමාන තත්ත්වය තක්සේරු කිරීම සඳහා පර්යේෂණයක් සිදු කිරීම 2024 ආරම්භ කරන ලද අතර බස්නාහිර පලාත නියැදිය ලෙස මෙහිදී යොදාගන්නා ලදී. එම අධ්‍යයනය අවසන් කර ඇති අතර ඉදිරි ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා එම වාර්තාවෙන් සොයාගත් කරුණු වැදගත් වනු ඇත.

තවදුරටත් ජාතික ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා වැදගත් වන ක්ෂේත්‍ර තුනක් ඔස්සේ පර්යේෂණ දියත් කිරීමට 2024 වර්ෂයේ දී කටයුතු ආරම්භ කර ඇත.

- පෙර පාසල් දරුවන්ගේ විෂයමාලාව සහ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ තීරණ ගැනීමේ දී වැදගත් වන පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන දරුවන්ගේ සූදානම පිළිබඳ ප්‍රාථමික පාසල් ගුරුවරුන්ගේ සංජානනය පිළිබඳ සිදු කරන පර්යේෂණයට අදාළ දත්ත රැස් කිරීම ආරම්භ කර ඇත.
- 11 වන ශ්‍රේණියේ දරුවන්ගේ වෘත්තීය සූදානම පිළිබඳ සිදු කරන පර්යේෂණයේ දත්ත රැස්කිරීම අවසන් අදියරේ පවතී.
- විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා අන්තර්කරණ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට පාසල්වල පවතින සූදානම පිළිබඳ පර්යේෂණ සැලසුම සකස් කරමින් පවතී.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍යතා අනුව මැදිහත් වීමට හැකිවීම ද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ලද මහගු අවස්ථාවකි. මෙම වර්ෂය තුළ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම 2024 වර්ෂයේ මුහුණ දුන් විශාල අභියෝගයකි. එම අභියෝගයට මුහුණ දී පැවරුණු කාර්යයන් සාර්ථක ලෙස නිම කිරීමට හැකිවීම පිළිබඳ සතුටු වෙමි.



පද්මිණී රණවීර
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

2025 සැප්තැම්බර්

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	**01-06**
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	**07-13**
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	**13-28**
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක	**29-30**
පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	**31-32**
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	**33-34**
පරිච්ඡේදය 07- අනුකූලතා වාර්තාව	**35-39**

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද්දේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම් සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීම සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීමේ අදහස ඇතිව අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අභිලාෂයෙනි.

තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පොදු එකගතාවක් ලැබීම අරමුණු කෙරෙන "අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජාතික කොමිසමක්" පිහිටුවීමේ දැඩි අවශ්‍යතාව පිළිගෙන ඇත. "එබඳු කොමිසමක් මගින් වහාම දස අවුරුදු සැලැස්මක් පිළියෙල කිරීමේ කාර්යය ආරම්භ කළ යුතු අතර 1991 වසර තුළ එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඇරඹිය යුතුය" යන තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ සඳහන් ඉහත කරුණු පාදක කරගෙන හා වරින් වර ඇතිවන දේශපාලන වෙනස්කම් නිසා කෙරෙන බලපෑම් වලින් බැහැර වූ අධ්‍යාපන ක්‍රමයක් සඳහා ස්ථිර හා නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වැදගත්කම හඳුනාගෙන ඒ සඳහා 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවා තිබුණි.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(1) වන වගන්තිය සහ 2(3) වන වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන නිර්දේශ ඇතුළත් වාර්තාව පාදක කරගෙන අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් වගකිවයුතු සියලු අධිකාරි හා ආයතන විසින් අනුකූලතාවක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

කොමිෂන් සභා පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ සංයුතියට අධ්‍යාපනය, පරිපාලනය, කළමනාකරණය යන ක්ෂේත්‍රවල හැකියාවක් ඇති තැනැත්තන් 10 දෙනෙකු සහ නිල බලයෙන් පත්වන සාමාජිකයන් 05 දෙනෙකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන අතර පනතේ 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන පූර්ණ කාලීන සභාපතිවරයා සහ උප සභාපතිවරුන් දෙදෙනකුන්ගෙන් ද කොමිෂන් සභාව සමන්විත වේ.

වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ 8 වැනි කොමිෂන් සභාවයි. (2020.02.28 දින සිට)

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

දැක්ම

දේශීය හා ගෝලීය අභියෝගවලට මුහුණදීමට අනුගත වූ සාමකාමී, එකමුතු ශ්‍රී ලාංකීය සමාජයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රගතිශීලීව සහ ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලබන්නාවූ සමාජයක්

මෙහෙවර

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, අදාලත්වය සහ අධ්‍යාපනයේ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීමේ අදහසින් අධීක්ෂණ සහ සහතික කිරීමේ භූමිකාවන් සමඟ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති, ඉලක්ක, නිපුණතා පැතිකඩ සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ප්‍රමිතීන් සැකසීමේ ප්‍රමුඛතම සංවිධානය ලෙස ක්‍රියා කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලවීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලුම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටෙක එම ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත උපදෙස් දීම.

1.4 සංවිධාන සටහන

Organizational Structure of National Education Commission



කොමිෂන් සභාවේ සාමාජිකයින්

පද්මිණී රණවීර මිය
සභාපති

කිංස්ලි ප්‍රනාන්දු මහතා
උප සභාපති (සැලසුම්)

ආචාර්ය හර්ෂ අලස් මහතා
උප සභාපති (ප්‍රතිපත්ති)

නිල බලයෙන් පත්වුණු සාමාජිකයින්

මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

බී.කේ.යූ. වික්‍රමසිංහ මහතා
සභාපති, තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

ජේ.එම්. තිලකා ජයසුන්දර මිය
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

චන්දිමා පුංචිහේවා මිය
අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය

එම්.එම්. නයිමුඩීන් මහතා
අතිරේක ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

අනෙකුත් සාමාජිකයින්

ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා

හිටපු උප කුලපති,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

ආචාර්ය කපිල බණ්ඩාර මහතා

පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතා

ළමා ස්නායු විශේෂඥ වෛද්‍ය,
රිජ්වේ ආර්යා ළමා රෝහල

ආචාර්ය ඉන්ද්‍රාණි තලගල මිය

හිටපු අංශ ප්‍රධානී,
මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ඩී.එම්.ඒ.ආර්.බී. දිසානායක මහතා

අග්‍රාමාත්‍ය ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය

ස්වාමිනාදන් විමල් මහතා

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
වාග් විද්‍යාව සහ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව,
යාපනය විශ්වවිද්‍යාලය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

හැඳින්වීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1. පවත්නා වැඩසටහන් සමාලෝචනය හා විශ්ලේෂණය තුළින් රටේ අධ්‍යාපන ප්‍රතිපත්ති ඇගයීම.
2. වර්තමාන අවශ්‍යතා අනුව අධ්‍යාපනික ප්‍රතිපත්ති යෝජනා යාවත්කාලීන කිරීම.
3. පවතින ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සම්බන්ධව සිදුකරන සමාලෝචන, විශ්ලේෂණ, තක්සේරු කිරීම් හා නවීකරණය මත පදනම්ව ජනාධිපතිතුමා වෙත අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් පරිදි ක්ෂේත්‍ර හතරක් යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු හතරක් ස්ථාපිත කර ඇත.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
2. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව.
3. උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
4. තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.



සෑම ස්ථාවර කමිටුවක්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අදාළ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වතුන් 15ක් 20 අතර සාමාජිකයින් පිරිසකගෙන් සමන්විත වේ.

2024 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් වල කාර්යසාධනය පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

1. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතෙහි පාසල්වල 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනෙහි වර්තමාන තත්ත්වය තක්සේරුව කිරීම පිළිබඳව පර්යේෂණය

ඕනෑම අධ්‍යාපනික වැඩසටහනක් හඳුන්වා දීමෙන් පසු, වැඩිදියුණු කිරීම සහ එහි විෂමතා අවම කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නිසි ඇගයීමක් කිරීම ඉතා වැදගත් වේ. එබැවින්, මෑතකදී හඳුන්වා දුන් 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන තක්සේරු කිරීම ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ රේඛීය අමාත්‍යාංශවලට ඉතා වැදගත් වේ. ඉහත අරමුණ අනුව, මෙම විස්තරාත්මක පර්යේෂණ අධ්‍යයනය ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතෙහි 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක පාසල් නියැදියක් ලෙස තෝරාගෙන සිදු කරන ලදී. මෙහිදී, පාසලේ තත්ත්වය ඇගයීම, සිසුන්ගේ ඇතුළත් වීමේ විස්තර, පවතින සම්පත් සහ විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන කෙරෙහි ඇති තෘප්තිය පිළිබඳව අවධානය යොමු කරන ලදී. ස්තෘත නියැදි ක්‍රමය හරහා ස්වයං-සකස් කරන ලද ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් දත්ත රැස් කරන ලද අතර, ලබාගත් දත්ත විස්තරාත්මකව ප්‍රමාණිකව සංඛ්‍යාත්මක ලෙස විශ්ලේෂණය කරන ලදී. එම සමීක්ෂණ ප්‍රතිඵලවලට අනුව, සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූ විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් මෙම වැඩසටහන කෙරෙහි, මෙන්ම මෙහි ඉගැන්වීම කෙරෙහිද සෑහීමකට පත් වූ බවක් දැකගත හැකිවිය. 2017 සිට 2022 දක්වා වසර හයක කාලය තුළ වෘත්තීය උසස් පෙළ විෂය ධාරාවට නවක සිසුන් ඇතුළත් වීමේ ඉහළ ප්‍රවණතාවක් ඇති අතර ඊට සමාන්තරව සැලකිය යුතු සිසු පිරිසක් වෘත්තීය අධ්‍යාපනය අත්හැරීමේ ප්‍රවනතාවයක්ද නිරීක්ෂණය විය.

වැඩිදුර ප්‍රතිඵල මගින් වැඩසටහනේ ප්‍රගතියට සහාය වීම සඳහා ගුරු කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු අවශ්‍යතාවයක් අනාවරණය වූ අතර, රසායනාගාර සහායකයින්, වැඩමුළු, අන්තර්ජාල පහසුකම් සහ පරිගණක වැනි සම්පත් සමීක්ෂණය කරන ලද නියැදිය තුළ හිඟ විය. එපමණක් නොව, උකහාගත් ප්‍රතිඵලවලින් පෙනී යන්නේ වෘත්තීය ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය ශක්තිමත් කිරීමට සහ වෘත්තීය විෂය අවශ්‍යතාවයට අනුකූලව කාලෝචිත ආකාරයකින් පුහුණු අධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමෙන් පාසල තුල ඔවුන්ගේ කාර්ය බහුලත්වය අවම කිරීමට රජයේ මැදිහත්වීම අවශ්‍ය බවයි. සමස්තයක් වශයෙන්, වෘත්තීය උසස් පෙළ විෂය ධාරාව සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වූවන් එම වැඩසටහන සඳහා ධනාත්මක තෘප්තියක් ලබා දී ඇති අතර, එහි අපේක්ෂිත අනිවාර්ය අධ්‍යාපන අරමුණුවලට අනුකූලව සැලකිය යුතු අ.පො.ස. සාමාන්‍ය පෙළ අසමත් සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන බස්නාහිර පළාත තුල සමත්ව ඇත.

2. පළමුවන ශ්‍රේණියට ඇතුළත්වන දරුවන්ගේ සූදානම පිළිබඳ ප්‍රාථමික පාසල් ගුරුවරුන්ගේ සංජානන

පාසලට සූදානම යනු පාසලට ඇතුළත් කිරීමට සහ සාර්ථකව ඉගෙනුම් කටයුතු අවසන් කිරීමට දරුවකුගේ ඇති සූදානමයි. ප්‍රජානන, සමාජීය, චිත්තවේගීය සහ ශාරීරික කුසලතා වැනි සංවර්ධනය කළ යුතු ක්ෂේත්‍ර පරාසයක් එයට ඇතුළත් වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ප්‍රාථමික පාසල් ගුරුවරුන් පෙර පාසල් දරුවන්ගේ පාසල් සූදානම සංජානනය කරන්නේ කෙසේද? සහ ප්‍රයෝජනයට ගන්නේ කෙසේද? යන්න විමර්ශනය කර අවබෝධ කර ගැනීමයි.

මෙම 2024 වර්ෂය අවසන් වනවිට දිවයින පුරා පාසල් නියෝජනය වන පරිදි ගුරුවරුන් 581ක නියැදියක් වෙත තැපැල් මාර්ගික ප්‍රශ්නාවලියක් යොමුකොට ඇත. ඒමගින් රැස් කරගන්නා ලද දත්ත විශ්ලේෂණය කොට ඒමගින් යෝජනා සහ නිර්දේශවලට එළඹීමට අපේක්ෂා කෙරේ. මෙහි නියමු පරීක්ෂණය බස්නාහිර පළාතේ තෝරාගත් පාසල් 11ක් ආශ්‍රිතව සිදු කොට ඇත.

3. පාසල්වල 11 ශ්‍රේණියේ සිසුන්ගේ වෘත්තීය සූදානම පිළිබඳ පර්යේෂණය

නිසි මාර්ගෝපදේශනයක් නොමැතිකම හේතුවෙන්, සිසුන් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු වෘත්තීය ඉලක්ක සමඟ සමපාත වේද යන්න තීරණය කිරීමේදී සහ ඔවුන්ගේ වෘත්තීය ගමන් සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය කිරීමේදී නිතර අභියෝගවලට මුහුණ දෙයි. බොහෝ සිසුන්ට වෘත්තීය සූදානමක් නොමැති අතර නිසි වෘත්තීය දිශානතියකින් තොරව ද්විතීයික සහ සමහර විට තෘතීයික අධ්‍යාපනික කටයුතු සිදු කරයි. එබැවින්, පාසල් අධ්‍යාපනය අතරතුර සිසුන් අනාගත වෘත්තීන් සඳහා සූදානම් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

අපගේ පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ පාසල් වල එකොළහ ශ්‍රේණියේ සිසුන්ගේ වෘත්තීය සූදානම තේමා 3 ක් යටතේ (අනාගතය ගවේෂණය කිරීම, අනාගතය අත්විඳීම සහ අනාගතය ගැන සිතීම) අධ්‍යයනය කිරීම සහ එම තේමාවන්ට අදාලව සිසුන් වෘත්තීයකට සූදානම් කිරීම සඳහා පාසල විසින් දැනට සිදු කරනු ලබන වැඩසටහන් පිළිබඳ අධ්‍යයනය කිරීම යි. මෙහිදී අධ්‍යයන නියැදිය ලෙස පාසල් 490 ක එකොළහ ශ්‍රේණියේ සිසුන් 8738 කට ප්‍රශ්නාවලියක් ලබා දීමට සැලසුම් කර ඇත.

දැනට අවසන් කර ඇති කාර්යයන්;

1. අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ජාතික අධ්‍යාපන ආයතනයේ උපදේශන හා මාර්ගෝපදේශ විෂයය සම්බන්ධව කටයුතු කරන නිලධාරීන් සමග එක්ව එකොළහ ශ්‍රේණියේ සිසුන් සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීම.
2. ශිෂ්‍ය උපදේශන හා මාර්ගෝපදේශ ගුරුවරුන් සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීම.

3. විදුහල්පතිවරුන්, උපදේශන හා මාර්ගෝපදේශ විෂයය සම්බන්ධව කටයුතු කරන පළාත් සහ කලාප අධ්‍යාපන කාර්යාල නිලධාරීන් සහ ගුරුවරුන් කණ්ඩායමක් සමඟ ප්‍රශ්නාවලියේ වලංගුතාව තහවුරු කර ගැනීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
4. ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තුමේන්තුවේ සහය ඇතිව මෙම ප්‍රශ්නාවලි පළාත් 9 තුළ බෙදා දීමට සුදුසු නියැදිය සකස් කිරීම.
5. තෝරාගත් පාසල් කිහිපයක නියමු අධ්‍යයනය සිදු කර ප්‍රශ්නාවලි යාවත්කාලීන කිරීම.
6. දිවයින පුරා තෝරාගත් නියැදියට අදාළ පාසල් සඳහා ප්‍රශ්නාවලි බෙදා හැරීම.

4. සමාගම් පනත හෝ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කර ඇති ජාත්‍යන්තර පාසල් සහ අනෙකුත් පෞද්ගලික පාසල් සඳහා තත්ත්ව සහතික රාමුව සහ යාන්ත්‍රණය පිළිබඳ අත්පොත.

සමාගම් පනත හෝ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි වී ඇති ජාත්‍යන්තර පාසල් සහ අනෙකුත් පෞද්ගලික පාසල් සඳහා තත්ත්ව සහතික කිරීමේ රාමුව සහ යාන්ත්‍රණය සකස් කිරීම මෙම 2024 වර්ෂය තුල සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතාවයක් ලෙස ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය විධිමත් නියාමනයකට ලක්කිරීම සහ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා මෙම කාර්යය විධිමත් කමිටුවක මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී. පිළියෙළ කරන ලද අවසන් වාර්තාව තෝරාගත් ජාත්‍යන්තර පාසල් නියැදියක් සමග සමාලෝචනය කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

එකී අවසන් වාර්තාවේ පරිච්ඡේද මගින් සමාගම් පනත හෝ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි ජාත්‍යන්තර පාසල් සහ අනෙකුත් පෞද්ගලික පාසල් සඳහා තිරසාර තත්ත්ව සහතික රාමුවක් ස්ථාපිත කිරීම සඳහා පූර්ව අවශ්‍යතා, තත්ත්ව ඇගයීම් ව්‍යුහය (නිර්ණායක, යහ භාවිතයන්, ප්‍රමිති), ස්වයං ඇගයීම් වාර්තාව සැකැසීම, සමාලෝචන මණ්ඩලය, සමාලෝචන ක්‍රියාවලිය සහ සමාලෝචන වාර්තාව සකසන අයුරුද මෙහි ඉදිරිපත් කර ඇත.

5. පාසල්වල ඉගැන්වීම් මාධ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සඳහා කෙටුම්පත් නිර්දේශ

2023 ජනවාරි 13 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අධිකරණ නඩුවක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද නියෝගයකට අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 'පාසල්වල අධ්‍යාපන මාධ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා නිර්දේශ' සැකසීම සඳහා විශේෂඥ කණ්ඩායමක් පත් කරන ලදී. මෙම කණ්ඩායම විසින් 1 සිට 11 ශ්‍රේණිය දක්වා පාසල්වල භාවිතා කෙරෙන ඉගැන්වීම් මාධ්‍ය සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛනය සමාලෝචනය කර, ශ්‍රී ලාංකේය සමාජයට දිගුකාලීන බලපෑමක් එල්ල කරන ඉගැන්වීමේ මාධ්‍ය පිළිබඳ ගැටලු සහ ප්‍රස්තුතයන් අවබෝධ කර ගැනීම සඳහා තවදුරටත් ක්ෂේත්‍ර 4ක් ගවේෂණය කරන ලදී. ඒ අනුව, (අ) නිදහසට පෙර සහ පසුව ඉගැන්වීමේ මාධ්‍යය පිළිබඳ ඓතිහාසික ඉදිරිදර්ශන සහ ඉගැන්වීමේ මාධ්‍යයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන අධ්‍යයනය කිරීම; (ආ) ඉගැන්වීමේ මාධ්‍යය ලෙස මව් භාෂාවේ වැදගත්කම සහ පාසල්වල දෙවන ජාතික භාෂාව (සිංහල සිසුන් සඳහා දෙමළ සහ දෙමළ සිසුන් සඳහා සිංහල) ඉගැන්වීම අධ්‍යයනය කිරීම; (ඇ) දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම සහ ඉගැන්වීමේ මාධ්‍යයක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම ගැන විමර්ශනය කිරීම සහ (ඈ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ පිළිබඳ විශ්ලේෂණයක් ඇතුළත් පාසල්වල ද්විභාෂා අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය විමර්ශනය කිරීම; සිදු කරන ලදී. පසුව ඒ පිළිබඳ සමාලෝචනය කර කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන ප්‍රතිපත්ති නිර්දේශ සහිත ඉගැන්වීමේ මාධ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සඳහා වන කෙටුම්පත් සම්පාදනය කළ අතර පාර්ශවකරුවන්ගෙන් තෝරාගත් නියැදියක් සමඟ නාභිගත කණ්ඩායම් සාකච්ඡා පවත්වා ඒවායේ වලංගුතාවය තහවුරු කරන ලදී. අවසාන වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශයට සහ අධ්‍යාපනය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කර ඇත.

2.2 පවත්නා අභියෝග

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මධ්‍යකාලීන කාර්යසාධන සංවර්ධන සැලැස්මට අනුව, සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ එකී අධ්‍යනයන් සඳහා පහසුකම් සපයන ආයතනික හා පරිපාලනමය අභියෝග පහත පරිදි වේ.

- නිසි පහසුකම්වලින් යුතු ස්ථිර කාර්යාලයක් ලබා ගැනීම.
- අත්‍යවශ්‍ය බඳවාගැනීම් සිදු කිරීම.
- කොමිෂන් සභාව විසින් සිදු කරන ලද උසස් ගණයේ ප්‍රතිපත්ති සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළ අමාත්‍යාංශ/ආයතන විසින් අවශ්‍ය පියවර නොගැනීම.

2.3 ඉදිරි ඉලක්ක

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මධ්‍යකාලීන කාර්යසාධන සංවර්ධන සැලැස්මට අනුව, සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ එකී අධ්‍යනයන් සඳහා පහසුකම් සපයන ආයතනික හා පරිපාලනමය ඉදිරි ඉලක්ක පහත පරිදි වේ.

- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පහසුකම් සහිත නව ස්ථානයක ස්ථාපිත කිරීම.

- ආයතනයේ නව සැලසුම් ඵලදායීව ක්‍රියාත්මක කරලීමට හැකි අධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවාගත හැකිවනු පිණිස හා බඳවාගත් නව නිලධාරීන් තවදුරටත් දිගුකාලයක් රඳවාගැනීමට හැකිවන පරිදි බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- නිසි පාරිශ්‍රමික දීමනා ගෙවීමට අදාළ අනුමැතීන් ලබාගැනීම.

- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව තවදුරටත් බලාත්මක කිරීමේ අරමුණින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම. එමගින්, දැනට කිසිදු ප්‍රමිති සහතික කිරීමේ හා වලංගු කිරීමේ ආයතනයක් විසින් සිදුකරනු නොලබන; මුල් ළමාවිය අධ්‍යාපනය, ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රමිති නිශ්චය කිරීම හා එම ප්‍රමිතියට අනුකූලව ක්‍රියාත්මක වන්නේදැයි අධීක්ෂණය කළ හැකි වන පරිදි ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව බලාත්මක කරමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.

පරිච්ඡේදය 03 -වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 ශේෂ පත්‍රය (මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය)

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	තත්‍ය 2023 රු.	
-	ආදායම් ලැබීම්		306,467	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	306,467	301,943	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		306,467	301,943	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		60,413,000	67,615,000	ඒසීඒ-3
-	තැන්පතු		8,475	10,250	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		1,135,803	746,879	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**61,557,278**	68,372,129	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**61,863,745**	68,674,072	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		1,187	849	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		61,862,558	68,673,223	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ-2(ii)
32,630,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	24,735,479	26,908,056	ඒසීඒ-2(ii)
36,707,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	30,249,330	32,261,184	ඒසීඒ-2(ii)
793,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	614,230	1,327,238	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
70,130,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**55,599,039**	60,496,478	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	ඒසීඒ-2(ii)
1,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	313,520	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
500,000	හැකියා වර්ධනය	14	328,831	309,625	ඒසීඒ-2(ii)
8,500,000	වෙනත් මූලධන වියදම්	15	4,433,313	6,057,251	ඒසීඒ-2(ii)
10,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**4,762,144**	6,680,396	
	තැන්පතු ගෙවීම්		11,375	7,350	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		1,490,000	1,489,000	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**1,501,375**	1,496,350	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**61,862,558**	68,673,224	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		-	-	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(66,466)	(180,734)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසීඒ-3
			(66,466)	(180,734)	

1

3.2 – අදාළ නොවේ

3.3 ආදායම් ප්‍රකාශය (මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය)

ඒසීඒ-8

2024 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	44,098,319	44,506,689
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	3,089,247	2,735,050
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**47,187,566**	**47,241,739**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		3,039,197	2,682,100
දේපළ පිරියත හා උපකරණ සංචිතය		44,098,319	44,506,689
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	50,050	52,950
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**47,187,566**	**47,241,739**

පිටු අංක...07...සිට ...32... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ....33... සිට ....37... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2025.02.27	දිනය : 25.02.2025	දිනය :
නාලක කළුවැව ලේකම් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය	පද්මිණි රණවීර සභාපති ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පළමු මහල, Block 5, බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.	ඩබ්.ඩී.එස්.පී. සිරිවර්ධන ගණකාධිකාරී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පළමු මහල, Block 5, බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.

3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන 2024 රු.	2023 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	306,467	301,943
අග්‍රිම ලැබීම්	60,413,000	67,615,000
අත්තිකාරම් අයකර ගැනීම්	1,135,803	746,879
තැන්පතු ලැබීම්	8,475	10,250
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**61,863,745**	**68,674,072**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	54,984,809	59,048,030
සහනාධාර සහ මාරුකිරීම්	614,230	1,327,238
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	121,210
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,187	849
අත්තිකාරම් ගෙවීම්	1,490,000	1,489,000
තැන්පතු ගෙවීම්	11,375	7,350
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**57,101,601**	**61,993,676**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,762,144**	**6,680,396**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	4,762,144	6,680,396
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**4,762,144**	**6,680,396**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(4,762,144)**	**(6,680,396)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අදාළ නොවේ.

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන රු.		තත්‍ය වියදම රු.	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්ථන	70,000,000	70,130,000	55,999,040	80
මූලධන	10,000,000	10,000,000	4,762,150	48

3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (ප්‍රාග්ධන)

අදාළ නොවේ.

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2024** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය රු.,000 රු.	**31.12.2024** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු.,000 රු.	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත රු.,000	ප්‍රගතිය %ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ හා කාර්යාලීය උපකරණ	43,797,120	43,797,120	-	-
9154	අස්පෘෂ වත්කම්	301,200	301,200		

3.10 විගණකාධිපතිගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. EDU/C/NEC/2024/15 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි 22 දින

සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

ශීර්ෂය 335 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 335 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබද ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබදුව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 22 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ,2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්ථාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම විගණකගේ වගකීම යන වගන්තියෙන් තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර

2

පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අත්තිකාරම්

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල අත්තිකාරම් ගිණුම් ශේෂය රු.2,849,247 ක් ලෙස ගැලපිය යුතු වුවත්, SA 50 භාණ්ඩාගාර සටහනෙහි ඇතුලත් රු.240,000 ක් වන බැර හරස් සටහන් ශේෂය ගැලපීමකින් තොරව රු.3,089,247 ක් ලෙස රු.240,000 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

1.6.2 ශුද්ධ වත්කම්/ස්කන්ධය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල අත්තිකාරම් ගිණුම් ශේෂය රු.240,000 කින් වැඩියෙන් පෙන්වීම හේතුවෙන් එම වටිනාකමින් මුළු වත්කම් ශේෂය, මුළු වගකීම් ශේෂය හා භාණ්ඩාගාර ශුද්ධ වත්කම් ශේෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 50 (1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා අවශ්‍යතාවයන් හඳුනාගෙන සකස් කළ යුතු වුවත්, ඒ අනුව ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 06 ක ප්‍රතිපාදන ඉතිරිවීමේ ප්‍රතිශතය සියයට 34 සිට 100 දක්වා පරාසයක පැවතුණි.

(ආ) කොමිෂන් සභාව විසින් ලබාදුන් තොරතුරු අනුව 2022,2023 හා 2024 යන වර්ෂවලදී රු.2,997,075 ක් වැයකර පර්යේෂණ යෝජනා 08 ක් නිමකර තිබුණි. ඊට අදාල පර්යේෂණ වාර්තා නිමකර අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු අදාල ආයතන වලට ලබා දී තිබුණු නමුත් 2025 පෙබරවාරි 05 දින දක්වාම ඒවායේ ප්‍රතිඵලය (OUT COME) පිළිබඳව සමාලෝචනයට ලක් කර නොතිබුණි. ඒ හේතුවෙන් කොමිෂන් සභාව සිදු කල පර්යේෂණ වාර්තා තුළින් ජාතික අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු කරන බලපෑම් (IMPACT) හඳුනාගත නොහැකි වූ අතර, ඒ අනුව කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවරට ලගාවීම පිළිබඳව හඳුනාගැනීමට යාන්ත්‍රණයක් සකස් කර නොතිබුණි.

4

2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) හා (2) වගන්ති ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

2.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණය**
(අ)	1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2 (1) වන වගන්තිය හා පනතේ 2 (2) වන වගන්තිය	ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයා වෙත කරනු ලබන නිර්දේශ හා දෙනු ලබන උපදෙස් සැලකිල්ලට ගැනීමෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කල යුතු වුවත් මෙම කොමිෂන් සභාව පිහිටුවා වසර 34 ක් ගත වී තිබුණද ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අනුමත කරගෙන නොතිබුණි.
(ආ)	2023 නොවැම්බර් 30 දිනැතිව නිකුත් කරන ලද අංක 02/2018 (I) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම උදෙසා වන මාර්ගෝපදේශයෙහි ඇතුලත් ආයතනයේ මානව සම්පත පිළිබඳව වූ කරුණු 5 කින් එක් කරුණක් පමණක් ඇතුලත් කරමින් මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර තිබුණි.
(ඇ)	භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 03 වන ඇමුණුම	මාර්ගෝපදේශ සංග්‍රහය අනුව වාර්ෂික වාර්තාව තුල අවම වශයෙන් ඇතුලත් විය යුතු කරුණු 12 කින් 2024 වර්ෂය වෙනුවෙන් සකස් කර තිබුණු වාර්ෂික වාර්තාවේ කරුණු 04 ක් ඇතුලත් කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ 13.3 වගන්තිය	කොමිෂන් සභාවේ ලේකම් හා ගණකාධිකාරි යන තනතුරු වලට පිළිවෙලින් මාස 06 ක් හා මාස 52 ක් වශයෙන් ආයතන සංග්‍රහයට පටහැනිව දීර්ඝකාලීනව වැඩ බැලීම් පත්වීම් ලබාදී තිබුණි.

2.4 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි ඡේද 9.1 මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව, එක් අවස්ථාවකදී රු.100,000 ක මූල්‍ය සීමාව ඉක්මවන විට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශය ද සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත් සභාව විසින් එම මූල්‍ය සීමාව ඉක්මවා රු.122,000 ක අත්තිකාරමක් ලබාදී තිබුණි.

(ආ) නිශ්චිත වූ කරුණු දෙකක් සඳහා අත්තිකාරම් ලබාදීමේදී එකම නිලධාරියාට රු100,000 නොඉක්මවන පරිදි රු.175,000 ක් හා රු.151,500 ක් වශයෙන් අත්තිකාරම් ලබාදීමේදී වවුචර 04 කින් ලබාදීමට කටයුතු කර තිබුණි.

(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි ඡේද 9.1 මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව, අතුරු අග්‍රිමයක් ලබාගත් පසු අදාළ කාර්යය අවසන් කළ විගසම අත්තිකාරම පියවිය යුතු වුවත් ලබාගත් අග්‍රිම පියවා නොතිබියදී අත්තිකාරම් මුදල් අතැති එකම නිලධාරීන්ට නැවත නැවත අත්තිකාරම් ලබා දී තිබුණි.

(ඈ) කොමිෂන් සභාවේ නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීමේදි නිසි ඇස්තමේන්තුවකින් තොරව මුදල් ලබාදී තිබුණු අතර අත්තිකාරම් මුදල් ඉතිරිවීමේ ප්‍රතිශතය සියයට 22 සිට 55 දක්වා පරාසයක පැවතුණි.

6

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට කාර්යයන් 06 ක් ඇතුලත් කර තිබුණු නමුත් ඉන් කාර්යයන් 02 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. ඉන් එක් කාර්යයක් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින්ද අනෙක් කාර්යය කොමිෂන් සභාවේ තීරණයක් මත බාහිර පාර්ශවයක් මගින්ද වශයෙන් නිමකර තිබුණු අතර ඉතිරි කාර්යයන් 04 න් 03 ක ඉටුකිරීමේ ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණු අතර සමාලෝචිත වර්ෂයේ ප්‍රමාණවත් කාර්යසාධනයක් ළගාකර ගැනීමට නොහැකි වී තිබුණි.

3.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතෙහි දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමට ප්‍රමුඛතාවය ලබාදී වාර්ෂිකව අභියෝග හා ඉලක්ක හදුනාගත යුතු වුවද එම ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම මූලික අරමුණු කරගනිමින් අභියෝග හා ඉලක්ක හදුනාගෙන නොතිබුණි.

3.2 අධිකාරී බලය නොලත් ගණුදෙණු

කොමිෂන් සභාවේ සුදුසුකම් සහිත සත්‍ය කාර්ය මණ්ඩලය පදනම් කරගෙන 2024 වර්ෂයට පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම 2024 ජූනි 13 දින කොමිෂන් සභාව විසින් අනුමත කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබුණු පර්යේෂණ 06 න් එකක් වන "සමාගම් පනත හෝ ව්‍යාපාරික ආඥා පනත යටතේ ලියාපදිංචි කර ඇති ජාත්‍යන්තර පාසල් සහ අනෙකුත් පෞද්ගලික පාසල් සඳහා තත්ත්ව සහතික රාමුව සහ යාන්ත්‍රණය" මැයෙන් වූ පර්යේෂණ යෝජනාව ශ්‍රී ලංකාවේ සමස්ථ අධ්‍යාපන පද්ධතිය නියාමනය වන පරිදි සැකසීම කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය යොදවා අපක්ෂපාතීව හා ස්වාධීනව සිදුකල යුතු නමුත් 2023 අගෝස්තු 24 දිනැතිව ලබාගත් කොමිෂන් සභා තීරණයක් මත පදනම්ව කොමිෂන් සභාවේ නොවන නිලධාරීන් 05 දෙනෙකු මඟින් රු.900,000 ක් වූ වටිනාකමකට ඉටුකර ගැනීමට තීරණය කර තිබුණි. එම තත්ත්වය කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය ක්ෂේත්‍ර 03 ක් යටතේ ජනාධිපතිවරයාට නිර්දේශ හා උපදෙස් ලබාදීම, ප්‍රශස්ථ මට්ටමින් ස්වාධීනව හා අපක්ෂපාතීව ඉටුකිරීමට බාධාකාරී වීමට ඉඩ ඇති බව විගණනය නිරීක්ෂණය කෙරෙන අතර, ඒ අනුව බාහිරව පත් කරන ලද කමිටුවට රු.750,000 ක් හා ප්‍රවාහන ගාස්තු රු.75,000 ක් ගෙවීමට කටයුතු කර තිබුණි.

3.3 ප්‍රසම්පාදනයන්

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) වගන්ති පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුලදී යාවත්කාලීන කල යුතු බව දක්වා තිබුණු නමුත් ප්‍රසම්පාදන සැලැස්මට වෙනස්ව කටයුතු කර තිබියදී, කොමිෂන් සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) සත්‍ය කාර්ය මණ්ඩලය 21 දෙනෙක් අනුයුක්තව සිටින කොමිෂන් සභාවේ ආයතන අවශ්‍යතාවයට වඩා වැඩි වර්ග අඩි ප්‍රමාණයකින් යුතු ආරක්ෂක, ජල, විදුලි හා සනීපාරක්ෂක පිරිසිදු කිරීම් සහිතව කාර්යාල පරිශ්‍රයක් මිල ගණන් කැඳවීමකින් තොරව ඉතා ඉහළ කුලී මුදලකට ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් විගණනය 2021 වර්ෂයේ සිට නිරීක්ෂණය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය දක්වාම ආයතනික අවශ්‍යතාවයට සුදුසු වර්ග අඩි ප්‍රමාණයක් ලබා ගැනීමකින් තොරව, වර්ග අඩි 3,748 ක් සඳහා රු.22,861,637 ක් සමාලෝචිත වර්ෂයේදීද ගෙවීම් කර තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

(අ) 2018 වර්ෂයේ දී රු.309,990 කට මිලදීගත්නා ලද වායුසමීකරණ යන්ත්‍රයක් 2021 වර්ෂයේදී අලුත්වැඩියා කිරීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත යොමුකර ඇති බව ඉකුත් වර්ෂයේදී විගණන වාර්තාවට පිළිතුරු ලෙස ඉදිරිපත් කලද ඊට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට වර්ෂ 04 ක් ගත වුවද කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි. ඒ අනුව අස්ථානගතවී තිබෙන මෙම වායුසමීකරණ යන්ත්‍රය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාල පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 වර්ෂයේ දී රු. 917,120 ක් වටිනා ස්ථාවර වත්කම් කාණ්ඩ 02 කට අයත් ඒකක 36 ක් බැහැර කල යුතු ලෙස හඳුනාගෙන තිබුණි. ඒවා බැහැර කිරීමේදී පාසැල් වෙත ලබාදෙන ලද පරිගණක මේස 02 ක් හා 2024 වර්ෂයේ විනාශ කරන ලද පරිගණක මුද්‍රණ යන්ත්‍ර 03 ක් පොත්වලින් ඉවත් කර නොතිබුණි. පාසැල් සඳහා ලබා දුන් ස්ථාවර වත්කම් හැර තවත් විධායක පුටු 02 ක් පොත් වලින් ඉවත් කලද බැහැර කිරීම පිළිබඳව සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව 2023 වර්ෂයේදී හඳුනාගත් අපහරණය කළ යුතු වත්කම් වලින් රු.699,743 ක වත්කම් අපහරණය කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාව විසින් සිදුකරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සත්‍ය ශේෂය හා ස්ථාවර වත්කම් ලේඛනය අතර වත්කම් කාණ්ඩ 02ක භාණ්ඩ වර්ග 10 ක් සැසඳීමේදී ස්ථාවර වත්කම් ලේඛනයට අනුව භාණ්ඩ ඒකක 22 ක ඌණතාවයක්ද භාණ්ඩ ඒකක 30 ක අතිරික්තයක්ද පැවතුණි.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යායපත්‍රය අනුව කොමිෂන් සභාවට අදාළ කරගත හැකි ලෙස හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක, අරමුණු හා දර්ශක හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

5 යහපාලනය

5.1 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියට අනුකූල වන පරිදි කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවතිය යුතු වුවත්, එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (EDU)
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට.

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

9

<table>
<tr><td colspan="3">ශීර්ෂය 335 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව. ශීර්ෂය 335</td></tr>
<tr><td>විගණන නිරීක්ෂණ අංකය</td><td colspan="2">පිළිතුර</td></tr>
<tr><td>1.6
1.6.1
1.6.2</td><td colspan="2">මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
ආයතයේ 2024 අත්තිකාරම් ගිණුම නිවැරදි පරිදි ගිණුම්ගත කර ඇති අතර 2024 අවසාන ගිණුම ද නිවැරදි පරිදි ගිණුම්ගත කර ඇත. භාණ්ඩාගාරය විසින් අදාළ ගිණුම්ගත කිරීම යාවත්කාලීන කරන ලද භාණ්ඩාගාර සටහන මේ වන විට ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 01)</td></tr>
<tr><td>2.1
(අ)
(ආ)</td><td colspan="2">වියදම් කළමනාකරණය
(අ) 2024 වාර්ෂික ඇස්තමේන්තු එවකට පැවති අවශ්‍යතා මත පදනම්ව සකසන ලද නමුත්, පසුකාලීනව (2023 දෙවන කාර්තුවේදී) මෙම ආයතනය අහෝසි කර අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අධ්‍යාපන කමිටුවක් ලෙස ස්ථාපනය කිරීමට යෝජනා වීම මත ආයතනයේ පැවැත්ම සම්බන්ධයෙන් වූ අස්ථාවරත්වය හේතුවෙන් ඇතැම් වියදම් සීමාකිරීමට සිදුවීම මත මෙම ප්‍රතිපාදන ඉතිරි විය.

(ආ) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 1991 අංක 19 පණත අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රධානතම අභිමතාර්ථය වන්නේ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිර්දේශ ජනාධිපතිවරයාට ලබාදීම වේ. අදාළ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වන්නේ ඒවා ක්‍රියාවට නැංවීමට බලය සහිත ඒ ඒ ආයතන සහ රේඛීය අමාත්‍යාංශය විසින් වේ. අප විසින් ලබාදෙනු ලබන එකී නිර්දේශ, ඒ සඳහා වගකිව යුතු සහ ක්‍රියාත්මක කිරීමේ බලය සහිත රේඛීය අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් ආයතන විසින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, මෙම ආයතනයේ පවත්වනු ලබන කොමිෂන් සභා රැස්වීම්වලදී සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ. තවද, මෙම පර්යේෂණ වාර්තා අදාළ පාර්ශවයන් වෙත යොමු කරනු ලබන්නේ එම ආයතනවල සිදු කරන වැඩසටහන්/ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී මේ පිළිබඳ අදාළ කර ගැනීමත් ඉදිරි පර්යේෂණ සඳහා භාවිත කිරීමත් සඳහාය.</td></tr>
<tr><td>2.2</td><td colspan="2">ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම.
මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතියක් පවත්වාගෙන යන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික වී ඇත. 2025 වසරට අදාළව සමාලෝචනයන් සිදුකර විගණකාධිපති වෙත වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ (ඇමුණුම 02).</td></tr>
<tr><td rowspan="3">2.3</td><td colspan="2">නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම</td></tr>
<tr><td>(අ)</td><td>අප ආයතනය සම්පාදිත අධ්‍යාපන ප්‍රතිපත්තිය (පළමු වාර්තාව) 1992 වර්ෂයේ ජනාධිපතිතුමා වෙත පිළිගන්වා ඇත. එමෙන්ම 2020-2030 දස අවුරුදු අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව අධ්‍යාපන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර ඇත. ආයතනය ස්ථාපිත කරන ලද දින පටන් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත ප්‍රකාරව ආයතනය වෙත පැවරී ඇති බලතල අනුව අප විසින් අධ්‍යාපනයේ සියලු අංශ ආවරණ වන පරිදි සිදුකර ඇති අධ්‍යයන පර්යේෂණ සහ සම්පාදිත අධ්‍යාපන ප්‍රතිපත්ති, බලාත්මක කිරීමේ බලතල සහිත අමාත්‍යාංශ ආයතන සහ අංශ වෙත නිසි කාලයේදී යොමුකර ඇත.

මෙම කොමිෂන් සභාවේ කාර්යය වනුයේ ප්‍රතිපත්ති යෝජනා සකස් කර ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම පමණක් වන අතර, එය ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම (1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(1) වගනතිය අනුව) සිදුකරනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් වේ.</td></tr>
<tr><td>(ආ)</td><td>02/2018 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව 2024 මානව සම්පත් සංවර්ධන සැලැස්ම සංශෝධනයට කටයුතු කරන ලදී. 2025 මානව සම්පත් සංවර්ධන සැලැස්ම 02/2018 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සකස් කරන ලදී.</td></tr>
</table>

	(ඇ)	වාර්ෂික වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය සහ අනුමැතිය ප්‍රකාරව සකස් කර ඇත. ආයතනය ක්‍රියාත්මක විය යුතු නිශ්චිත ආකෘතිය (සංස්ථාවක් ද දෙපාර්තමේන්තුවක් ද යන්න) තහවුරු කරගැනීමට විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී. එහි නිගමනය මත පදනම්ව වාර්ෂික වාර්තා සඳහා වන ආකෘතිය නිශ්චය කරගැනීමට නියමිතය.
	(ඈ)	ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ ලේකම් තනතුර සඳහා නිලධාරියෙකු පත්කරනු ලබන්නේ අතිගරු ජනාධිපතිතුමා විසිනි. 2025.06.19 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ දී ආයතනයේ පවතින පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු කරමින් පවතී.
2.4	**තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**	
	(අ) (ආ) (ඇ) (ඈ)	ආයතනයේ පැවති නිලධාරී හිඟය මත අධ්‍යයන පර්යේෂණ කිහිපයකට අදාළව සමගාමීව පවත්වනු ලැබූ වැඩමුළු සඳහා වෙන් වෙන් වශයෙන් අත්තිකාරම් ලබාගැනීමට සිදුවීම මත මෙම තත්වය ඇති විය. මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව අත්තිකාරම් ලබාදීම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුම්වත් කරන ලද අතර ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
3.1.1	**කාර්යභාරයන් ඉටු නොකිරීම**	
	එවකට පැවති රජය මගින් ඉදිරිපත් කරන ලද නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වාර්තාව අනුව ජාතික අධ්‍යාපන කොමිෂමේ පැවැත්ම සම්බන්ධව අස්ථායී තත්ත්වයක් පැන නැගුණ බැවින් වසරේ මුල් සීමාව තුළ 2023 වසරේ අවසන් කලයුතු සියලුම වැඩ කටයුතු අවසන් කොට 2024 වසරේ වාර්ෂික සැලැස්මේ කටයුතු තාවකාලිකව ක්‍රියාත්මක නොකරන ලෙසට වාචිකව සභාපතිවරයාට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මගින් දැනුවත් කොට තිබුණි. එම තත්වය යටතේ වසරේ මැද භාගයේ එම කටයුතු ආරම්භ කිරීමට සිදු වූ බැවින් ඒ වන පැවති ප්‍රගතිය මෙලෙස ඉදිරිපත් කර ඇත.	
3.1.2	**වාර්ෂික කාර්යසාධන වාර්තාව**	
	වාර්ෂික අභියෝග හා ඉලක්ක නිවැරදිව හඳුනාගෙන ඇත. පනත ප්‍රකාරව ආයතනය වෙත පැවරී ඇති කාර්යභාරය ප්‍රශස්තව ඉටුකිරීම සඳහා භෞතික සහ මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පවත්වාගෙන යාම සඳහා රැස්වීම් පැවැත්වීම් කටයුතු යනාදිය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ගොඩනැගිල්ලක ස්ථිර වශයෙන් ස්ථාපිත කිරීම සහ ආයතනයේ කාර්යභාරය ප්‍රශස්ත අන්දමින් සිදුකරගැනීම සඳහා පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම අත්‍යාවශ්‍ය කාර්යයන් ලෙස හඳුනාගෙන ඇත.	
3.2	**අධිකාරී බලය නොලත් ගණුදෙණු**	
	කොමිෂන් සභාවේ බලතල ප්‍රකාරව ස්වාධීන වාර්තාවක් සකස් කිරීමේ දී එය සෑම විටම එම විෂය ක්ෂේත්‍රයේ පෘථුල දැනුමත් සහිත විශේෂඥ කමිටුවත් මගින් ඉටු කරනු ලබන අතර ජාතික අධ්‍යාපන කොමිෂන් සභා රැස්වීම් වෙත ඉදිරිපත් කර එමගින් ද අනුමැතිය ලබා ගනු ලැබේ. ඒ සඳහා බලතල ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත 10.1 මගින් නිසි පරිදි ලබා දී ඇත. එම පූර්ව කරුණු පදනම්ව මෙම විශේෂඥ කමිටුව අන්තර්ජාතික පාසැල් සම්බන්ධයෙන් වන සමාලෝචන වාර්තාව සකස් කිරීමට යොදා ගන්නා ලදී. මෙම මුදල වාර්ෂික සැලැස්මට ඇතුලත් කර කොමිෂන් සභාවේ පූර්ව නිර්දේශය හා අනුමැතිය අනුව ගෙවීම් කර ඇත.	
3.3	**ප්‍රසම්පාදනයන්**	
	(අ)	නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිර්දේශ පදනම්ව 2024 වර්ෂයේ ආයතනයේ පැවැත්ම සම්බන්ධයෙන් වූ අස්ථාවරත්වය මත 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම එලෙසින්ම ක්‍රියාත්මක කරන ලදී. 2025 ප්‍රසම්පාදන සැලැස්ම නියමිත කාලසීමාව තුළ අවශ්‍යතාවය මත පදනම්ව යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.

	(ආ)	2021 වර්ෂයේ බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය සමඟ එළඹි බදු කුලී ගිවිසුම, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ වාර්ෂිකව දීර්ඝ කරගැනීම සිදුකර ඇත. 2025.06.19 දින අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් පැවති කොමිෂන් සභා රැස්වීමේ දී ආයතනය සඳහා ස්ථිර පදනමින් කාර්යාල ඉඩපහසුකම් සළසා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. ඒ අනුව ඉදිරි කටයුතු කරමින් පවතී.
3.4	**වත්කම් කළමනාකරණය**	
	(අ)	වායුසමීකරණ යන්ත්‍රය සම්බන්ධයෙන් ආයතනික මට්ටමින් කමිටුවක් පත්කර විමර්ශණයක් සිදුකරන ලදී. ඉදිරි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී එම කමිටු වාර්ථාවේ නිර්දේශ සම්බන්ධයෙන් සාකච්ඡා කර මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි පියවර අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ.
	(ආ)	පාසල් වෙත ලබාදෙන ලද පරිඝණක මේස 02 සහ 2024 වර්ෂයේ නිශ්කාර්ය වත්කම් බැහැර කිරීම් නිර්දේශ මත විනාශ කරන ලද පරිඝණක මුද්‍රණ යන්ත්‍ර 03 පොත්වලින් ඉවත් කර ශේෂයන් නිවැරදි කර ඇත. පාසල් වෙත ලබාදෙන ලද විධායක පුටු දෙකෙන් එක් පුටුවක් බප/ගම්/ගුරුවල ප්‍රාථමික විද්‍යාලය වෙත ලබා දී ඇත. අනෙක් පුටුව ආයතනය තුළ පවතින බව භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ බැවින්, එම වත්කම නැවත වත්කම් ලේඛනයට ඇතුළත් කර ශේෂය නිවැරදි කර ඇත (ඇමුණුම 03). රු. 699,743.00 ක වත්කම් ඒකක දෙක ආයතනයේ රඳවා ගන්නා ලෙස ඉහළ කළමනාකාරීත්වය ලබාදුන් වාචික උපදෙස් මත තවදුරටත් ආයතනයේ රඳවා ගැනීමට කටයුතු කර ඇත.
	(ඇ)	භාණ්ඩ සමීක්ෂණයේ දී අනාවරණය වූ ඌන සහ අතිරික්ත භාණ්ඩ සම්බන්ධයෙන් තවදුරටත් විමර්ෂණය කර මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.
4.1	**තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම**	
	ආයතනයේ විෂය පථයට අදාළව අනුගත කරගත හැකි තිරසර සංවර්ධන ඉලක්ක, අරමුණු හා දර්ශක හඳුනාගැනීමට කටයුතු කරනු ලැබේ.	
5.1	**විගණන හා කළමනාකරණ කමිටුව**	
	නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිර්දේශ පදනම්ව 2024 වර්ෂයේ ආයතනයේ පැවැත්ම සම්බන්ධයෙන් වූ අස්ථාවරත්වය මත එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පැවැත්වීමට සිදු විය. 2025 වර්ෂය සඳහා නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු යොදා ඇත.	

පරිච්ඡේදය 04 - කාර්ය සාධක දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධක දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100%-90%	75%-89%	50%-74%	50අඩු %
		අදාළ නොවේ		

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීම

5.1 තිරසාර සංවර්ධන අරමුණු

සැමට එක හා සමාන ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

5.2 තිරසාර සංවර්ධන අරමුණු වල ජයග්‍රහණ සහ අභියෝග

අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේදී අදාළ තිරසාර සංවර්ධන (SDG) ඉලක්ක සාක්ෂාත් කරගැනීම සහතික කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2020-2030 තුළ තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම පාදක කරගත් ප්‍රතිපත්තිමය නිර්දේශ, අන්තර්ගත කර ඇත.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ විෂයපථය වනුයේ අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් සැකසීම වන අතර, ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කළ යුතු ආයතන විසින් එම ඉලක්ක හා අරමුණු සැකසිය යුතුව ඇත.

පරිච්ඡේදය 6 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	12	05	07
තෘතියික	10	03	07
ද්විතියික	10	07	03
ප්‍රාථමික	10	07	03

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තයේ බලපෑම

අදාළ නොවේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වසරේ අවසන් පුහුණු සැලැස්ම පහත පරිදි වේ.

තෝරා ගත් පුහුණු වැඩසටහන්	ඉලක්කගත කණ්ඩායම	පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණ	කාල පරාසය	අපේක්ෂිත නිපුණතා මට්ටම වෙත ළඟා වීම සඳහා වන යාන්ත්‍රණය
ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 01	සමත්වීම
රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම පිළියෙළ කිරීම	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 01	සමත්වීම
බඳවා ගැනීම් පරිපාටිය පිළිබඳ වැඩමුළුව	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 02	සමත් වීම
කාර්යාල කාර්ය සහයකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල නැංවීම පිළිබඳ වැඩමුළුව	කාර්යාල කාර්ය සහයක	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 02	සමත් වීම
ගබඩා කළමනාකරණය සහ මිලදී ගැනීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ වැඩමුළුව	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 02	සමත් වීම
රාජ්‍ය ගිණුම්කරණ ක්‍රමවේදය දැනුවත් කිරීම සහ අවසාන ගිණුම් පිළියෙළ කිරීම සඳහා වූ පුහුණු වැඩමුළුව	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 02	සමත් වීම
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය පිළිබඳ වැඩමුළුව	කළමනාකරණ සේවා නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 02	සමත් වීම
අධ්‍යයන පර්යේෂණ සම්බන්ධ වැඩමුළුව	ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී, ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී, වැඩසටහන් නිලධාරී	කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය සහ කාර්යයන් පහසු කිරීම, දැනුම යාවත්කාලීන කර ගැනීම	දින 03	සමත් වීම
දෙමළ පාඨමාලාව	වැඩසටහන් නිලධාරී කළමනාකරණ සේවා නිලධාරී	භාෂා ප්‍රවීණතාවය ලබාගැනීම	පැය 150	සමත් වීම
දෙමළ පාඨමාලාව	රියදුරු	භාෂා ප්‍රවීණතාවය ලබාගැනීම	පැය 100	සමත් වීම
දෙමළ පාඨමාලාව	ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී, ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී	භාෂා ප්‍රවීණතාවය ලබාගැනීම	පැය 200	සමත් වීම
ධාරිතා සංවර්ධන දෙදින පුහුණු වැඩමුළුව	සියලු කාර්ය මණ්ඩලය	කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය සහ කාර්යයන් පහසු කිරීම,	දින 02	සමත් වීම
Master of Public Administration in Education Management	වැඩසටහන් නිලධාරී	දැනුම යාවත්කාලීන කර ගැනීම/ අභ්‍යන්තරික උසස්වීම් සඳහා	අවු. 01	සමත් වීම

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)		අදාල නොවේ	අදාල නොවේ
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම		අදාල නොවේ	අදාල නොවේ
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම		අදාල නොවේ	අදාල නොවේ
1.6	වෙනත්	කිසිවක් නැත	කිසිවක් නැත	කිසිවක් නැත
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ	අනුකූල වේ		

	පාලනයට යටත්ව කටයුතු කිරීම			
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		අභ්‍යන්තර විගණන අංශයක් නොපැවතීම	අභ්‍යන්තර විගණන අංශයක් නොමැතිවීම හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය හරහා මෙම අවශ්‍යතාව සපුරා ගැනීමට කටයුතු කර ඇත.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විමසුම**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		අභ්‍යන්තර විගණන අංශයක් නොමැත.	ඉහත 4.3 පිළිතුර අදාළ වේ.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම		අදාළ නොවේ	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම		අදාළ නොවේ	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම		අදාළ නොවේ	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම		රැස්වීම් වාර 01 ක් පවත්වා ඇත.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිදේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම		අදාළ නොවේ	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම		අනුකූල නොවේ.	අක්‍රීය බැංකු ගිණුම් නොමැත.
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම		අනුකූල නොවේ	එවැනි ශේෂ නොමැත
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම		අනුකූල නොවේ	හිඟ හිටි ශේෂ නොමැත
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට	අනුකූල වේ.		

	ප්‍රේෂණය කර තිබීම			
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම		අදාළ නොවේ.	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය		අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී	අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී.

	සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම			
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

වයි.ආර්. හේවාසිලියන්ගේ
වැඩබලන වැඩසටහන් නිලධාරී (මූලා)
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව